# අලංකාරවාදයට ප්‍රවේශයක්

මාවතගම පේමානන්ද හිමි

The Alankara doctrine in Sanskrit Poetics is perhaps as old as the theory on 'poetry' itself. The term Alankara has a broad as well as a narrow connotation. It stands for Kavyasaundarya or poetic beauty itself in broad significance. In Vedas, Alankaras such as Upama are seen used. In Niruktha, the synonym Karmopama, Bhoothopama, Roopopama, Sidhopama etc. are also seen used by Yaska. By Panini's time, Upama had attained poetical acceptability. Panini had also used the words Upamana, Upamitha, Samanya, Upama etc. as Oupamya, Upamitha, Sadrisya etc. It cannot be gainsaid that Alankaras were subjected to scientific treatise for the first time by Bharatha. He has defined four Alankaras, viz. Upama, Roopaka, Deepaka and Yamaka. He has also given a list of thirty six Alankaras. The prominent Acharyas in Alankara Sampradaya are Dandin, Bhamaha and Udbhata. They have merged Rasa in Alankara. It was Rudrata who classified Alankara as Sabdalankara and Arthalankara. This paper contains a glimpse of these Alankaras.

ලොව පවත්නා සාහිත්‍යයන් අතර අද්විතීය ස්ථානයක් සංස්කෘත සාහිත්‍යයට හිමි වේ. වෛදික යුගයෙන් ඇරඹි මෙකී සාහිත්‍යය ලෞකික හෙවත් ව්‍යවාහාරික සංස්කෘතය බිහි වීමත් සමග තවදුරටත් සංවර්ධනය වෙයි. සංස්කෘත සාහිත්‍ය විචාරවාද බිහි වීම වූකලි සංස්කෘත සාහිත්‍යයේ අභිවර්ධනීය අවස්ථාවකි. රසවාදය, අලංකාරවාදය වැනි සාහිත්‍ය විචාරවාද බිහි වන්නේ කාව්‍යය විෂයෙහි විද්වතුන් තුළ පහළ වූ ප්‍රශ්න කිහිපයක් මුල් කොට ගෙන ය. කාව්‍යය යනු කුමක් ද? කාව්‍යයේ ආත්මය කුමක් ද? කාව්‍ය ශරීරය යනු කුමක් ද? කාව්‍යාර්ථය යනු කුමක් ද? කාව්‍යයේ

භූෂණය කුමක් ද? කාව්‍යයේ විශිෂ්ටත්වය කුමක් ද? කාව්‍යයේ ප්‍රයෝජන කුමක් ද? යනාදිය ඒ අතර කිහිපයකි. මෙකී ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමේ දීර්ඝකාලීන උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙන් විවිධ විචාරවාද ව්‍යවහාරයට පැමිණි අතර කාව්‍ය විචාරය අතිශය පුළුල් විෂයක් බවට පත් වෙයි. රසවාදය, අලංකාරවාදය, ගුණවාදය, රීතිවාදය, ධ්වනිවාදය, අනුමිතිවාදය, වක්‍රෝක්තිවාදය, ඖචිත්‍යවාදය යනු සංස්කෘත විචාරවාද සාහිත්‍යය පෝෂණය කළ විචාර සිද්ධාන්ත අටකි. එයින් කාව්‍ය අලංකරණය මුල් කොට ගෙන බිහි වන විචාරවාදය වන්නේ අලංකාරවාදය යි.

අලංකාරවාදය කාව්‍යකරණය කෙරෙහි බෙහෙවින් බලපෑ විචාරවාදය යි. මහාකාව්‍ය සම්ප්‍රදාය පෝෂණය වන්නේත් මෙමගිනි. අනෙක් සියලු වාද ඉදිරියේ සංස්කෘත කවියා බෙහෙවින් ගරු කළ වාදය වන්නේත් අලංකාරවාදය මැ යි. බොහෝ විචාරකයන් කාව්‍යාලංකාර විෂයෙහි දක්වා ඇති සැලකිල්ල අතිවිශාල ය. මෙම ලේඛනයේ අපේක්ෂණය වන්නේ එම අලංකාරවාදය පිළිබඳ කෙටි සමාලෝචනයක යෙදීම යි.

කාව්‍ය විචාරවාද අතර රසවාදය කාව්‍ය සංකල්පයක් ලෙස මුලින් ම හඳුන්වා දෙන්නේ භරතමුනි විසිනි. ක්‍රි.පූ. 4 සියවසේ විසූ මොහු විසින් රචිත නාට්‍යශාස්ත්‍ර නම් කෘතිය පළමුවරට රසවාදය විග්‍රහ කරයි. කාව්‍ය විචාරවාදයේ ආරම්භකයා ලෙස සැලකෙන භරතමුනි රස නිෂ්පත්තිය සඳහා විභාව, අනුභාව, ව්‍යභිචාරීභාව යන භාවත්‍රය අවශ්‍ය බව පෙන්වා දුණි (විභාවානුභාවව්‍යභිචාරීභාවසංයොගාද්‍රසනිෂ්පත්තිඃ. -නාට්‍යශාස්ත්‍ර). මෙලෙස ජනිත වන රස ප්‍රධාන කොටස් 8කට බෙදා ඇත. ඒවා නම්, ශෘංගාර, හාස්‍ය, කරුණ, රෞද්‍ර, වීර, භයානක, බීභත්ස්‍ය අද්භූත යනුවෙනි. රසය යනු කාව්‍යයක් බාහිර ව සරසන අලංකරණයක් වශයෙන් සැලකූ භරතමුනි එය කාව්‍යයේ පරමාර්ථය ලෙස භාර නො ගනී. පසුව විසූ දණ්ඩී, වාමන, උද්භට, මම්මට වැනි විචාරකයෝ මෙය තවදුරටත් සංවර්ධනය කරති.

ගුණ, රීති යන වාද දෙක ම එකක් ලෙස විග්‍රහ කිරීමට බොහෝ විචාරකයන් කැමැත්තක් දක්වා ඇත. කාව්‍ය ශාස්ත්‍රයේ විවිධ රීතීන් හඳුනා ගැනීමේ දී ගුණ පදනම් වන බැවින් ගුණ හා රීති එකට ගෙන විග්‍රහ කරන්නට ඇත. ගුණ සංකල්පය පළමුවරට විග්‍රහ වන්නේ භරතමුනි ගේ නාට්‍යශාස්ත්‍රයේ ය. මෙය තවදුරටත් විග්‍රහ කෙරෙන්නේ දණ්ඩී අතිනි. කාව්‍යය ශුභ නොහොත් සජීවී තත්ත්වයට පමුණුවන ධර්ම පද්ධතියක් වශයෙන් ගුණ හැඳින්වේ (කාව්‍යශෝභාකර්තාරෝ ධර්මා ගුණාඃ). ඒවා කාව්‍යප්‍රාණ වශයෙන් ද පිළිගැනෙති. රීති යනු කිසියම් විශේෂයක් දරන්නා වූ පද රචනය යි. එම විශේෂත්වය ගුණය ආත්ම කොට පවතී (විශිෂ්ටපදරචනා රීතිඃ. විශේෂෝ ගුණාත්මා. කාව්‍යාලංකාරසූත්‍ර. I.2.6, 8).

භරතමුනි ගුණ 10ක් දක්වන අතර දණ්ඩී ඒවා දශප්‍රාණ වශයෙන් නම් කරයි. කාව්‍යයක වටිනාකම වැඩිවීමට බෙහෙවින් උපකාරවත් වෙයි. තව ද එකී ගුණ මතු වන්නේ කාව්‍යය දෝෂයන් ගෙන් තොර වන විට ය (රසාපකර්ෂකා දොෂාඃ). එම නිසා ගුණ හා රීති එකට ගෙන විග්‍රහ කරනු මෙන් ගුණ හා දෝෂ ද එකට විග්‍රහ කෙරේ. 'රීති'

යන විචාරවාදය ලේඛකයා ගෙන් ලේඛකයාටත් දේශයෙන් දේශයටත්, පරිසරයෙන් පරිසරයටත් වෙනස් වන්නක් බව පිළිගැනේ. එබඳු වූ 'රීතිය' පිළිබඳ වාමන ගේ අදහස 'රීතිය යනු කාව්‍යයේ ආත්මය (රීතිරාත්මා කාව්‍යස්‍ය - කාව්‍යාලංකාරසූත්‍ර. I.2.6)' බව යි. එය එසේ සඳහන් කර තිබුණත් එහි පවත්නා ප්‍රායෝගිකත්වයේ මඳ බව නිසා 'රීති' යන්න දීර්ඝ කාලයක් විචාරකයන් ගේ සම්භාවනාවට පාත්‍ර නො වී ය. රීතිය පිළිබඳ ව දණ්ඩී ගේ අදහස වන්නේ සුළු සුළු වෙනස්කම් ඇති කාව්‍ය රීති හෙවත් මාර්ග විශාල ප්‍රමාණයක් දක්නට ඇති බවත් ඒ අතර වෛදර්භී, ගෞඩී යන දෙක ප්‍රධාන බවත් යඃ

''අසත්‍යනෙකො ගිරාන් මාර්ගාන් - සූක්ෂ්මභෙදඃ පරස්පරම්,

තත්‍ර වෛදර්භගෞඩීයෞ - දෘශ්‍යතෙ ප්‍රස්ඵුටාන්තරෞ.''

(කාව්‍යාදර්ශ. I.41)

ධ්වනිවාදය යනු කාව්‍යයේ මතු පිටින් පෙනෙන අර්ථය හෙවත් වාච්‍යාර්ථය ඉක්මවා යන ව්‍යංග්‍ය හෙවත් යටින් දිවෙන, සැඟවුණු අර්ථය යි. ව්‍යංගයෙන් පවසන අරුත ධ්වනිය ලෙස සැලකේ. කිසියම් කාව්‍යයක අලංකාරය සුරැකීමට මෙකී ධ්වනිය විශාල මෙහෙයක් සිදු කරයි. ධ්වනිය වාදයක් ලෙස සංවර්ධනයට පත් වන්නේ ආනන්දවර්ධන අතින් ධ්වන්‍යාලෝකය රචනා වීමත් සමග ය. ඉන්පසු අභිනව ගුප්ත ආදීන් වෙතින් මෙය තවදුරටත් පෝෂණය වෙයි.

කාව්‍යයක පැවතිය යුතු උචිත භාවය පදනම් කොට ගෙන ඖචිත්‍යවාදය බිහි වෙයි. ඒ පිළිබඳ බීජ නාට්‍යශාස්ත්‍රයේ ඇත ද එය සංවර්ධනයට පත් වන්නේ ක්ෂේමේන්ද්‍ර ගේ ඖචිත්‍යවිචාරචර්චාව ගේ සම්ප්‍රාප්තියත් සමග ය.

වක්‍රෝක්තිය හෙවත් කාව්‍ය ප්‍රකාශන පිළිබඳ වක්‍රතාව කාව්‍යයේ ජීවය වශයෙන් පිළිගැනීමෙන් බිහිවන්නේ වක්‍රෝක්තිවාදය යි. අලංකාරවාදයට බෙහෙවින් නැකම් කියන එය ක්‍රි.ව. 11 සියවසේ සිටි රාජානක කුන්තක විසින් වක්‍රෝක්තිජීවිත රැසයීමෙන් ව්‍යාප්තියට පත් වෙයි.

සියලු විචාරවාද අතුරින් කාව්‍ය විචාරවාදයේ ආරම්භයේ සිට අඛණ්ඩව සංවර්ධනයට පත් වෙමින් අද දක්වා කාව්‍ය විචාරවාදීන් ගේ සම්භාවනාවට පාත්‍ර වූ විචාරවාදයක් වෙයි. එනම් අලංකාරවාදය යි. කාව්‍ය සෞන්දර්යය පෝෂණයට ඉවහල්වන කරුණු අඩංගු කරමින් විවරණය කරමින් දියුණු වී ගිය ශාස්ත්‍රය අලංකාර නමින් ප්‍රසිද්ධියට පත් වෙයි. තව ද දණ්ඩීන් පවසා ඇත්තේ කාව්‍යයේ ශෝභාව ඇති කරන ධර්මයන් අලංකාර බව යි.

''කාව්‍යශොභාකරාන් ධර්මානලංකාරාන් ප්‍රචක්ෂතෙ''

(නාට්‍යශාස්ත්‍ර. II.1)

කිසියම් කාව්‍යයක් ලස්සන වන්නේ මෙකී අලංකාරවලින් සමලංකෘත වූ විට යි. කාන්තාව ස්වභාවයෙන් ම සුරූපී වුවත් එම සුරූපී බව ප්‍රකට වන්නේ සළුපිළි අබරණවලින් සැරැසී ගත් විට යි. කාව්‍යයක් සඳහා අලංකාරයන් ගේ ආවශ්‍යකත්වය

ද මෙබඳු ය. මේ බව වටහා ගත් සෑම මහාකාව්‍ය රචකයකු ම තම කාව්‍ය නිර්මාණ අලංකාරවලින් සැරසීමට අමතක නොකළහ. විශේෂයෙන් අශ්වඝෝෂපාද, කාලිදාස වැනි පූර්වකාලීන කවීන් විසින් මෙන් ම භට්ටි, භාරවී, මාඝ, ශ්‍රී හර්ෂ, කුමාරදාස වැනි අපරකාලීන කවීන් විසින් ද ස්වකීය නිර්මාණ විෂයෙහි සාර්වකාලීන අගයක් ඇති කරනු ලැබුවේ අලංකාර පිළිබඳ දක්වන ලද විශාල සැලකිල්ල නිසා ය.

සංස්කෘත සාහිත්‍යයේ රස, ධ්වනි ආදි විචාරවාද රැසක් බිහි වුව ද අලංකාරවාදය අබිබවා යන්නට ඒ කිසිවකට නොහැකි වෙයි. කාව්‍ය විචාරවාදීන් අතර භරත පටන් විශ්වනාථ, මම්මට ආදි සෑම අයකු ම තම විචාරවල අලංකාර සඳහා නොමඳ සැලකිල්ලක් දක්වා ඇත. රස, ධ්වනි ආදියේ විටිනාකම තහවුරු වූ පසුව පවා කුවලයානන්ද ආදි විචාරකයන් මේ පිළිබඳ අවධානය යොමු කර ඇත.

අලංකාරවාදය පිළිබඳ ව මුලින් ම කරුණු දක්වන භරතමුනි තම නාට්‍යශාස්ත්‍ර නම් කෘතියෙහි අලංකාර 4ක් (නාට්‍යශාස්ත්‍ර. XVI.41) ද ගුණ 10ක් (නාට්‍යශාස්ත්‍ර. XVI.97) ද දෝෂ 10ක් (නාට්‍යශාස්ත්‍ර. XVI.89) ද කාව්‍යලක්ෂණ 36ක් ද දක්වයි. එහි දැක්වෙන ඇති අලංකාර 4 මෙසේ ය.

1. යමක
2. උපමා
3. රූපක
4. දීපක යනුවෙනි

මේවායින් යමක ශබ්දාලංකාරයක් ලෙසත් අනෙක් තුන අර්ථාලංකාර ලෙසත් ප්‍රභේදගත වෙයි.

භරතමුනි ගෙන් පසුව හමුවන ශ්‍රේෂ්ඨ අලංකාරවාදියා භාමහ යි. ක්‍රි.ව. 7 සියවසේ ජීවත් වූ මොහු ගේ අලංකාරවාදය පිළිබඳ ප්‍රකට ග්‍රන්ථය කාව්‍යාලංකාරය යි. මෙම කෘතියෙන් ප්‍රධාන කරුණු 2ක් විග්‍රහ කරයි. එකක් කාව්‍ය දෝෂ වන අතර අනෙක අලංකාර යි. මොහු දක්වන පරිදි අලංකාර සියල්ල 38ක් වන අතර ඉන් දෙකක් ශබ්දාලංකාර ය. ඉතිරි 36 අර්ථාලංකාර වෙයි. භාමහ අලංකාරවල ආවශ්‍යකත්වය පෙන්වා දෙමින්:

> ''රූපකාදිරලංකාරස්තථාන්‍යෛර්බහුධොදිතම්,
> න කාන්තමපි නිර්භූෂං විභාති වනිතානනම්''
>
> (කාව්‍යාලංකාර-භාමහ I.13)

යනුවෙන් සුන්දර කාන්තාවක වුව ද ආභරණවලින් තොර ව නොබබළයි. එලෙස කාව්‍ය අලංකාර මගින් විසිතුරු වන බව භාමහ අවධාරණයෙන් ප්‍රකාශ කරයි. අලංකාර පිළිබඳ දක්වන භාමහ:

> ''රූපකාදිමලංකාරං බාහ්‍යමාචක්ෂතෙ පරෙ''

(කාව්‍යාලංකාර-භාමහ I.14)

රූපකාදි අලංකාර බාහිර යැ යි සමහරුන් පවසන බව කියයි. එමගින් ඔහු කීමට බලාපොරොත්තු වන්නේ ඇතැමුන් අලංකාර බාහිර ලක්ෂණ සේ සැලකුවත් තමන් එසේ නොසලකන බව යි. එහෙත් අලංකාර කාව්‍යයේ ආත්මය යැ යි පැවසීමට භාමහ ඉක්මන් වී නැත.

භාමහ ගෙන් පසුව අපට හමුවන අලංකාරවාදියා වන්නේ ක්‍රි.ව. 8 සියවසේ විසූ උද්භට යි. මොහු කාව්‍යාලංකාර ග්‍රන්ථයට භාමහ විවරණ නම් ටීකාවක් ද කාව්‍යාලංකාර නම් ස්වතන්ත්‍ර රචනාවක් ද කළේ ය. ඒ අතර ගුණ-මාර්ග (රීති) සංකල්පය කෙරෙහි වැඩි උනන්දුවක් දැක්වූ දණ්ඩී ද අලංකාරවාදය කෙරෙහි ස්වකීය අවධානය ලක් කිරීමට අමතක නො කරයි. අලංකාර ශබ්දාලංකාර, අර්ථාලංකාර යි වර්ග දෙකකට ද නැවත අර්ථාලංකාර ස්වභාවොක්ති, වක්‍රෝක්ති වශයෙන් ප්‍රධාන ප්‍රභේද දෙකකට ද වක්‍රෝක්ත්‍යාලංකාරය උපමා, රූපක, දීපකාදි අලංකාර 34කට ද පෙළ ගස්වන මොහු කාව්‍යාදර්ශයේ දී එකතු ව අලංකාර 35ක් ඉදිරිපත් කරයි. ක්‍රි.ව. 9 සියවසේ විසූ රුද්‍රට නැමැත්තා ද කාව්‍යාලංකාර නම් විචාර ග්‍රන්ථයක් රචනා කරමින් අලංකාරවාදය සංවර්ධනය කරයි. ඊට අමතර ව මම්මට අලංකාර 61ක් ද රුය්‍යක අලංකාර 75ක් ද චන්ද්‍රාලෝකයෙහි අලංකාර 100ක් ද කුවලයානන්දයෙහි අලංකාර 125ක් ද වශයෙන් අලංකාර බොහෝ විචාරකයන් අතින් විවිධ ප්‍රභේදවලට ලක් වී ඇති බව පෙනේ. ඒ අනුව භරතමුනි 4ක් වශයෙන් දැක්වූ අලංකාර ක්‍රමයෙන් සංඛ්‍යාත්මක ව වැඩෙමින් කුවලයානන්දය වන විට අලංකාර 125ක් තරම් විශාල සංඛ්‍යාවක් දක්වා වර්ධනය වීම අලංකාර සංකල්පයේ එක්තරා සංවර්ධනීය අවස්ථාවක් වශයෙන් ද කාව්‍ය විචාරවාද විෂයෙහි අලංකාරවල පවත්නා ආවශ්‍යකත්වය හා අලංකාර පිළිබඳ විචාරවාදීන් දැක්වූ වැඩි සැලකිල්ල විදහා පාන්නක් වශයෙන් ද හැඳින්විය හැකි ය.

අලංකාරවාදය අතිශයෝක්තියක් ලෙස පවසන ඇතැම් විචාරකයෝ වක්‍රෝක්තිය අතිශයෝක්තියට යොදන පර්යාය වචනයක් ලෙස හඳුනා ගනිති. වක්‍රෝක්තියෙන් තොර ව අලංකාරයක් නැතැ (සෛෂා සර්වෛව වක්‍රෝක්තිරනයාර්ථො විභාව්‍යතෙ, යත්නොස්‍යාං කවිනා කාර්යඃ කො'ලංකාරො'නයා විනා. කාව්‍යාලංකාරය II.85) යි භාමහ ප්‍රකාශ කරන්නේ මේ නිසා විය යුතු ය. මේ අනුව පැහැදිලි වන එක් කරුණක් වන්නේ අලංකාරය, වක්‍රෝක්තිය හා අතිශයෝක්තිය යන තුන ම එක ම තැනකට ගොනු වන බව යි. ඒ අතර භරතමුනි දැක්වූ අලංකාර සතරින් උපමා අලංකාරය ද පශ්චාත්කාලීන ව විවිධ ප්‍රභේද ඔස්සේ වර්ධනය වූ බව පෙනේ.

අර්ථාලංකාර හා ශබ්දාලංකාර යන ප්‍රභේද දෙකක් යටතේ අලංකාර විස්තර කරන දණ්ඩී ඊට අමතර ව ගුණ මාර්ග දෙක ද අලංකාර වශයෙන් හඳුන්වා ඇත. වාමන ගේ අදහස වන්නේ අලංකාරය යනු කාව්‍යය පුරා පැතිර පවත්නා සෞන්දර්ය නොහොත් චමත්කාරය බව යි (සෞන්දර්යමලංකාරඃ කාව්‍යාලංකාර-වාමන I.2). ඔහු සෞන්දර්යයට හේතු වන ගුණ, රීති, ධ්වනි ආදි ඕනෑ ම අංගයක් අලංකාර ලෙස හඳුන්වයි. අපරකාලය වන විට අලංකාරයන් ගේ ප්‍රභේද සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය

වූවා පමණක් නො ව, එහි අර්ථය ද ක්‍රමයෙන් පුළුල් බවට පත් වනු පෙනේ.

අලංකාරවාදීන් දක්වන පරිදි කාව්‍යය ප්‍රධාන කොටස් 2කට බෙදේ. එනම්, කාව්‍ය ශරීරය, කාව්‍ය අලංකාර වශයෙනි. කාව්‍ය ශරීරය යනු ශබ්ද අර්ථ දෙකේ සංයෝගය යි. එනම් වචන ප්‍රබන්ධය යි. අලංකාර යනු කාව්‍ය ශරීරය සරසන ආභරණ යි. කිසියම් ප්‍රබන්ධයක් කාව්‍යයක තත්ත්වයට පත් වන්නේ අලංකාරවලින් යුක්ත වූ විට ය. කිසියම් වචන සමූහයක් පෙළ ගැස්වූ පමණින් එය කාව්‍යයක් නො වේ.

හිරු පායයි; සඳ බැස යයි; කුරුල්ලෝ පියාඹති
(ගතො'ස්තමර්කො භාතීන්දුර්යාන්ති වාසාය පක්ෂිණඃ,
ඉත්‍යෙවමාදි කිං කාව්‍යං වාර්තාමෙනාං ප්‍රචක්ෂතෙ.
කාව්‍යාලංකාරය II, 87)

වැනි වාක්‍ය කාව්‍ය නො වේ. ඒවා හුදෙක් වගන්ති කථන පමණි. ඒවා කාව්‍ය වන්නේ අලංකාරවලින් සැරසුණු විට ය. කිසියම් රචනයක් ආහ්ලාදයක් බවට පමුණුවන විශේෂ ගුණය අලංකාර ලෙස දක්වා ඇත. මේ නිසා අලංකාර වනාහී කාව්‍යයෙහි අනිවාර්ය අංගයකි. කාව්‍ය ශරීරය ශබ්ද-අර්ථ දෙකින් යුක්ත වන්නා සේ ම අලංකාර ද ශබ්දාලංකාර, අර්ථාලංකාර යනුවෙන් දෙකොටසකට බෙදේ. ශබ්දය හොබවන ආභරණය ශබ්ද අලංකාරය යි. එනම්, ශබ්ද මාධූර්යය යි. එළිසම, යමක අනුප්‍රාස ආදි ක්‍රමවලින් ශබ්ද මාධූර්යය ඇති කළ හැකි ය. අර්ථාලංකාර යනු පවසන අරුත ඔප් නංවන කියුම් විශේෂය යි. එනම්, උපමා, රූපක, උත්ප්‍රේක්ෂා ආදිය යි. කිසියම් කියමනක් එක එල්ලේ ඍජු ව නො පවසා මෙබඳු විශේෂ ක්‍රමයකට පැවසීම තුළින් අමුතු චමත්කාරයක් ජනිත වේ. උදාහරණයක් ලෙසඃ

'ඉර බැස යන විට අහස රතු පැහැවෙයි' යන වැකිය

''පතසන් අවර ගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල''

යනුවෙන් පැවැසීමෙන් සිතට මනරම් ආහ්ලාදයක් ගෙන දෙයි. කාව්‍යය විෂයෙහි අලංකාර මගින් සිදුවන සේවාව මෙය යි. අනෙකුත් රස, ධ්වනි, රීති ආදියට වඩා අලංකාර ප්‍රධාන වන්නෙත් විචාරවාදයක් වශයෙන් අලංකාරවාදය අතිදීර්ඝ කාලයක් මුළුල්ලේ අභිවර්ධනයකට පාත්‍ර වන්නේත් එහි පවත්නා මෙකී වැදගත් කම නිසා ය.

අලංකාරවාදය හැරුණු විට අනෙක් බොහෝ විචාරවාද පිළිබඳ කතිකාව කෙටි කලකට පමණක් සීමා වූ බව පෙනේ. එසේ ම ඒ පිළිබඳ උනන්දුවක් දැක්වූ විචාරකයන් සංඛ්‍යාව ද සීමිත ය. එහෙත් අලංකාරවාදය පිළිබඳ තත්ත්වය ඊට හාත්පසින් ම වෙනස් ය. අලංකාරවාදය විෂයෙහි වූ චර්චාව ඉතා දිගුකලක් පුරා ඉතා පුළුල් ව ව්‍යාප්ත වූවකි. එම විචාර වාදය ද ඇතුළු ව බොහෝ විචාර සංකල්පවල නිර්මාතෘ භරතමුනි ගේ පටන් සෑම විචාරවාදියකු විසින් ම නොමඳ සැලකිල්ලක් දක්වන ලද විචාරවාද සංකල්පය වන්නේ අලංකාරවාදය යි. එසේ ම සෑම කවියකු විසින් ම

කාව්‍යය නිර්මාණ විෂයෙහි බෙහෙවින් පිළිගන්නා ලද ප්‍රමුඛතම කාව්‍යාංගය වූයේ ද අලංකාර ම බව පෙනේ.

මේ අනුව ප්‍රකට වන්නේ සෙසු කාව්‍ය විචාරවාද අතර අලංකාරවාදය ඉතා අවශ්‍ය මෙන් ම ඉතා වැදගත් කාව්‍යාංගයක් වන බව යි. එනිසා සාහිත්‍යක්ෂේත්‍රයේ දී ඊට ප්‍රමුඛතාවක් හිමි වෙයි. එසේ ම එය සෑම විචාරවාදියකු ගේ මත් කවියකු ගේ මත් සැලැකිල්ල බඳුන් වෙයි. එම පසුතලය තුළ කාව්‍යය විෂයෙහි අත්‍යාවශ්‍යක කාව්‍යමය සාධකයක් වශයෙන් කරළියට පත් අලංකාර සංකල්පය පදනම් කොට ගත් අලංකාරවාදය කාව්‍ය සාහිත්‍යක්ෂේත්‍රයේ අනෙක් විචාරවාද අබිබවමින් විචාරවාදයක් වශයෙන් අභිසංවර්ධනයක් වෙත ගමන් කළ බව විවාදරහිත ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.**


වැලිවිටියේ සෝරත නායක ස්ථවිර, හල්තොට දේවානන්ද ස්ථවිර. (සංස්.). (2001). දණ්ඩීන් ගේ *කාව්‍යාදර්ශය*. සමයවර්ධන, කොළඹ.

කුලසූරිය, ආනන්ද. (සංස්.). (1966). ශ්‍රී වාමන ගේ *කාව්‍යාලංකාර සූත්‍ර වෘත්තිය*. සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ගම්ලත්, සුචරිත, (1970). *නාට්‍යශාස්ත්‍රයේ රසවාදය*. රත්න පොත් ප්‍රකාශකයෝ. කොළඹ 10.

ධර්මකීර්ති, තලකිරියාගම, (1969). *භාරතීය කාව්‍ය විචාරය*. (භාමහ විරචිත කාව්‍යාලංකාර 1-4 පරිච්ඡේද සහ සිංහල අනුවාදය), දීපා මුද්‍රණාලය, කැලණිය.

බදරොනාථ, හරිදාස. (සංස්.). (1977). ශ්‍රීමද් ආනන්දවර්ධන ගේ ධ්වන්‍යාලොක. *සංස්කෘත ග්‍රන්ථමාලා*. චෞඛම්බා සංස්කෘත සීරීස් ආෆීස්, වාරාණසී.

සේනානායක, ජී. එස්. බී. (පරිව.). (1965). බෙරිඩේල් කීත් ගේ *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය*. සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

මාරසිංහ, වෝල්ටර්. (1994) *භරතමුනි ප්‍රණීත නාට්‍යශාස්ත්‍ර*. ප්‍රථම භාගය, ගංගොඩවිල.

මෛත්‍රීපාල, මා. (1998). *රස හා ලකර*. සාහිත්‍ය කාව්‍ය රස, අලංකාර හැඳින්වීමකි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

රේවත හිමි, උඩවෙල. (2010). *සකු කවි ලකුණු*. සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම, කොළඹ.

සද්ධානන්ද ස්ථවිර, පින්වත්තේ, (1959). *අලඞ්කාර චන්ද්‍රිකා*. ප්‍රථම භාගය, කරුණාධාර මුද්‍රණාලය, පානදුර,

හේමපාල විජයවර්ධන, ජී. (1967). *සංස්කෘත කාව්‍යවිචාරයේ මූලධර්ම*. සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

Keith, A. Berriedale. (1996). *A History of Sanskrit Literature*. Motilal Banarasidass Publishers Private Limited, Delhi.

Macdenell, Arthur A. (1997). *A History of Sanskrit Literature*. Motilal Banarasidass Publishers Private Limited, Delhi.